# සිංහල විලාසිතා උපත හා විකාශය

ජාතික කලා පෙරමුණේ සභාපති හා පරම ධම්ම චෛතිය පිරිවෙන් විහාරාධිපති හා අධ්‍යක්ෂ

**මාපලගම විපුලසාර ස්ථවිර**

කලාත්මක දියුණුවක් ලබා ඇති හැම රටකම මෝස්තර පිළිබඳ දියුණුවද සැලකිය යුතුය. මේ ගැන ඈත අතීතය දක්වා පරීක්ෂාකරණ කෙනෙකුට අවසානයේ නතර වීමට සිදුවන තැනකි. එනම් ස්වාභාවික වස්තූන් වෙතය. අපේ පැරණි සිංහල සැරසිලි මෝස්තර හා ලෝකයේ සෙසු රටවල මෝස්තර අතර ප්‍රධාන වෙනයකි. යුරෝපීය සෑම රටකම වගේ ස්වභාවික ගස් වැල් මල් කොළ ගෙඩි ආදිය එලෙසම සැරසිලි චිත්‍රලෙස සකස් කරගත් අතර, ආසියාතික රටවල්, විශෙෂයෙන් බෞද්ධ පරිසරයෙන් ඔප්නැගුනු රටවල්, එම ස්වාභාවික ලක්ෂණ අනුව වඩාත් විසිතුරු ලෙස මවාගත් සැරසිලි ක්‍රමයක් දියුණු කරගත් බව පෙනේ. නා නා විධ ක්‍රමයන් අතරෙන් මා මේ ලිපියෙන් විස්තර කිරීම්ට මුල්කරගත්තේ ලියපත් කැටයම් හෙවත් ලතා පත්‍ර නම් මෝස්තර ලක්ෂණයි. මේ නමින් හඳුන්වන මෝස්තර ලක්ෂණයේ මූල ධර්ම ලෙස පිළිගත යුතුව තිබෙන්නේ ස්වාභාවික කොල ආදර්ශකර ගත් බවයි. මෙහි පළමුවැනි චිත්‍රයෙන් ඒ පිළිබඳ ක්‍රම විකාශය පෙන්වා ඇත. පළමුවෙනි ලක්ෂණය සාමාන්‍ය කොලයකි. දෙවෙනි කොලය තරමක් කැඩී බිඳී ගිය කොලයකි. තුන්වැනි කොලය ඊටත් වඩා කැඩුනු කොලයකි. හතරවැනි කොලය පැත්ත පෙරලුනු හැඩයයි. පස්වැනි කොලය එයම ලතා පත්‍රයක් බවට සකස් වූ අයුරුයි. මේ ආදර්ශ චිත්‍රවලින් මා පෙන්වූයේ ස්වාභාවික හැඩ වුවත් විසිතුරු වූ තරමට යි කලාත්මක වන්නේ යනුයි. සාමාන්‍යයෙන් ඍජු හැඩ වැඩ වල එතරම් කලාත්මක බවක් නැති බව අපේ නිගමනයයි. යම් හැඩයක් වක්‍රව හෝ වෙනයම් කිසි ආකාරයකට හෝ සකස් වී ඇතිනම් හෝ සකස්කරයි නම් එබඳු දේ කලාත්මකයි. ඒ වගේම ලක්ෂණයි, යනුවෙන් ප්‍රකාශ කිරීමට කලාව නොදන්නා අයට වුවද පුරුදු පුහුණු වුවකි. මෙහි අංක දෙකට යොද ඇති ආදර්ශ චිත්‍රයෙන් එය පැහැදිලි වේ. මෙහි ඍජු රේඛාවකි. එය ඇහැට එතරම්ම ප්‍රිය නැත. දැකීමට තරම් සිත් ඇලීමක් නැත. ටික වේලාවක් ඒ දෙස බලා

1






සිටි විට ඇහැට වේදනා දෙනසුලුය. එහෙත් ඊට දෙවනුව ඇති ඇදට හා වක ගැසුනු සටහන දෙස බලන්න. එහි ඒ මුලින් කී දෝස නැත. හොඳට ඒ දෙස බලා ඉන්න. සිතට ප්‍රිය ගෙන දෙයි. ඇසට අපහසුවක්ද නැත. ඒ වගේම ඊලඟට ඇති වැඩිපුර වක ගැසූ සටහනද බලන්න. එහි යම් කිසි ප්‍රශ්නයක් ඇත. විසිතුරු වී කලාත්මක වුවද ප්‍රමාණයට වඩා විසිතුරු කිරීමද ඊට හානියකි. ඒ සමගම දෙවෙනි අංකයට අයිති හතරවැනි චිත්‍රයද බලන්න. එය තනි රේඛාව නොව රේඛා දෙකක් වක්‍රව එක්තැන් වූවකි. ඒ පිළිබඳවද කිවයුත්තකි. විසිතුරු වූවත් තනි රේඛාව කලාත්මක භාවය අඩුය. ඒ සමාන හැඩ දෙකක් හෝ ඊට වැඩි ගනනක් එකතුවීමද විචිත්‍ර භාවයේ ලක්ෂණයකි. එමෙන්ම පස්වෙනි අංකයද විමසිලිව බලන්න. වක්වූ විසිතුරු රේඛා කීපයක සම්පිණ්ඩනයකි. මුලින් සඳහන් කළ කීපයටම වඩා දැකුම් කලුය. විසිතුරු රේඛා කලාත්මක බව සැබෑය. එහෙත් එකතු කිරීමේදී ප්‍රවේසම් විය යුතුය. ඒ ගැන සැලකිය යුතු උපදෙස් කීපයකි. පළමුව ගහන බැවින් තොර විය යුතුය. සම පරතර සහිත වීමද, දිග පළල අනුව සම්පිණ්ඩනය කිරීමද, ඉඩ ප්‍රමාණය අනුව රේඛාව ප්‍රමාණ කිරීමද, රේඛා අඩු වැඩි කිරීමද ප්‍රධාන වගකිවයුතු කරුණු ය. යම්කිසි විවේචකයෙක් හෝ කලා උගතෙක් යම් චිත්‍රයක් හෝ මෝස්තරයක් වර්ග කිරීමට මේ කී කරුණු මුල් කරගන්නා බව විශෙෂයෙන් සැලකිය

3



4



යුතුයි. එමෙන්ම 6 වැනි චිත්‍ර සටහන බලන්න. එහි පළමුවකී දෝෂ සහිතයි. ප්‍රමාණය අනුව පරතර ඉඩ වැඩි බව දකින විටම පෙනේ. ඒ දෝෂය මගහැර තරමක් සකස් කළ විට 7 වැනි චිත්‍රය මෙන් විසිතුරු විය යුතුයි. එහි යම් කිසි කලාත්මක වූ වටිනා කමක් පෙනේ. හේතුව ඒ මුලින් කී දෝසවලින් තරමක් වෙන්වී ඇති බැවිනි. මෙතෙක් කී කරුණුවලින් ඔප්පු කිරීමට මා උත්සාහ කළේ මෝස්තර සඳහා මූල ධර්ම කෙසේ සකස් කරගත යුතුද යනුයි.

දැන් මීලඟට ලිපියට අරමුණු කරගත් ලිය පත් ගැන සඳහන් කරමු. මෙහි 3 වැනි චිත්‍ර සටහන දෙස බලන්න. එහි පළමු වැනි ලිය පත ස්වාභාවික කොලයක් පැත්තකට ඒ චිත්‍රයේම නැමූ ආකාරය මූල ධර්ම කරගෙන විසිතුරු කරණ අයුරු බලන්න. අංක දෙක තරමක් වක ගසා ඇත. තුන්වැනි සටහන ඊටත් වඩා වැඩිකර ඇත. හතරවැනි සටහන තවත් දියුණු කර ඇත. මේ ලියපත් ක්‍රමය ක්‍රමයෙන් වක දෙක තුන හතර ආදී වශයෙන් දියුණු වූ පැරණි චිත්‍ර මෝස්තර නටබුන් අතර අදත් විද්‍යාමානය. හතරවැනි චිත්‍ර මෝස්තරය ඊට නිදසුන්ය. වක පහකින් සකස් වූ එකම ලිය පතක් ලෙස මේ චිත්‍රය හැඳින්විය හැක. මෙබඳු මෝස්තරයක විශේෂ සම්මත නීති රීති කීපයක් තිබේ. පළමු හැඩයට වඩා ක්‍රමයෙන් ඊලඟ වකය ප්‍රමාණයෙන් කුඩා වියයුතුවා පමණක් නොව හැඩ වැඩ වලින් ද අඩුකළ යුතුය. ඊලඟ වකද එලෙස කුඩා කර අවසානය ක්‍රමයෙන් සිහින් කිරීම සිරිතයි. මේ හැර එහි මැද යොදන වක සහ විසිතුරු හැඩද මුල් වකය වමතට නම් දෙවෙනි හැඩය දකුණට විය යුතුය. ඒ ආදී වශයෙන් අවධාරණයෙන් ම සම්මත නීති රීති ඇතුලත් මේ පියපත් ක්‍රමය විශේෂයෙන් සිංහල මෝස්තර වල ප්‍රධානත්වයක් ගන්නා බව අපේ නිගමනයයි. මෙබඳු මෝස්තර වැඩි වශයෙන් ලියවැල් ලෙස චිත්‍ර කිරීමට උපයෝගි කරගත් අතර තවත් නොයෙක් ක්‍රමයේ භාණ්ඩවල විසිතුරු කම දැක්වීමට යෙදීම සිරිත වශයෙන් පෙනේ. මෙසේ ලියපත් වලින් නව නිර්මාණ කරණ කෙනෙකුට කොතෙකුත් ස්වාභාවික වස්තුම විකෘති කර නිපදවිය හැක. විශේෂයෙන් විකෘති විකාශන චිත්‍ර මෝස්තර සඳහා මේ ලියපත අවශ්‍යම අංගයක් ලෙස පෙන්විය හැක.

මෙහි 5 වැනි අංකය දරණ චිත්‍රය බලන්න. එය ස්වාභාවික මූලික හැඩය සිටින සේ ලියපත් මෝස්තර එකතු කළ විසිතුරු චිත්‍රයකි. එමෙන්ම 6 වැනි අංකය දරණ චිත්‍රයද බලන්න. ඕනෑම සත්ව රූපයක්ද ඒ ස්වභාව ගතිය පෙනෙන සේ මේ ලියපත් වලින් නිරූපනය කළ හැක. හංසයෙකු ගේ ඔලුවක හැඩය ගත් ඒ ලියපත් ගොමුව ඊට නිදසුන්ය. 7 වැනි චිත්‍රය එලෙසම

සිංහ ඔලුවක අයුර දක්වන මෝස්තරයකි. එහි ස්වභාවික සිංහ ගති පිළිඹිබුවන සේ මේ ලතා පත්‍ර කෙසේ ගැලපිය හැකිදැයි බලන්න. 8 වැනි චිත්‍රයද නවත් නිදසුනකි. මිනිස් ඔලුවක හැඩය පෙන්වන ඒ චිත්‍රය මේ ලියපත් මූලික කරගත් විකට චිත්‍රයකි. ඒ මෝස්තරයද මේ ලියපත් වලින් කළහැකි විවිධ මෝස්තර සඳහා නව නිර්මාණයකි. මෙයේ මූලධර්ම වශයෙන් විස්තර කිරීමට මූලික කරගත් ලියපත් ගැන කිවයුතු බොහෝ කරුණු හා පෙන්විය හැකි නිදසුන් ඇති බැවින් මේ ලිපිය මෙතෙකින් නවත්වා මින් ඉදිරියට පලවන සෙසු කලාපවලදී මේ පිළිබඳ පිළිවෙලින් ලිපි සැපයීමට කල්පනාවට ගතිමු.



5



6



7



8